CSS/7/6/3/2/2013 2014.02.12

දකුණු පළාතේ,

අමාත්‍යාංශ ලේකම්වරුන් හා

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමහර ශ්‍රේණි වලට මුදල් ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2013.11.25 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් දැනුම් දුන් පරිදි රජයේ නිවාඩු දින හා සති අන්ත සේවා කිරීම වෙනුවෙන් මසකට දින 02 ඉක්මවා සේවය කිරීමට අනුමත කරනු ලබන්නේ ඉතාමත් අත්‍යාවශ්‍ය හා කල්දැමිය නොහැකි හදිසි රාජකාරී කටයුතු පැවරුනු විශේෂ අවස්ථාවකදී පමණි. එනමුත් සමහර අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ප්‍රධානීන් එසේ නොවන අවස්ථා සඳහා ද අතිරේක නිවාඩු දින වැටුප් අනුමැතිය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබ ඇත.

03. එබැවින් ඉතා අත්‍යාවශ්‍ය කල්දැමිය නොහැකි විශේෂ හා හදිසි රාජකාරී කටයුතු පැවරුනු අවස්ථාවකදී පමණක් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයේ ඒ බව සඳහන් කර පූර්ව අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව අවධාරණය කරමි..

ඩබ්.කේ.කේ.අතුකෝරල,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත .

පිටපත : අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස